*සැ. යු.* - 2017.12.08 වැනි දින පළ වූ අංක 2049 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,050 - 2017 දෙසැම්බර් මස 15 වැනි සිකුරාදා - 2017.12.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 3018 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 3020 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 3021 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 3025 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජනවාරි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය

**ගර්හිත පාලම් සුන්බුන් බැහැර කිරීම**

අංකය : SRS/F.7539

01. පහතින් විස්තර කර ඇති පරිදි ගර්හිත පාලම් සුන්බුන් බැහැර කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් මුද්‍රා, තබන ලද ලංසු භාරගනු ලබයි. පහතින් විස්තර කර ඇති 01 සිට 05 දක්වා වූ අයිතමයන් සඳහා ලංසු වෙන් වෙන් වශයෙන් ඇගයීම් කර ප්‍රදානය කරනු ඇත.

| *අනුක්‍රමික අංකය* | *ස්ථානය* | *ප්‍රමාණය (සාමාන්‍යයෙන්)* |
|---|---|---|
| 01. | Close to 53M 31ch Bridge at Ambalangoda | මෙ/ටො. 30.0 |
| 02. | Close to Medawachchiya Permanent Way Inspector's Office | මෙ/ටො. 25.0 |
| 03. | 75 M 13ch Old Bridge Between Katugoda, Thalpe Railway Stations | මෙ/ටො. 65.0 |
| 04. | 161M 55Ch Old Bridge Between Vauniya, Omanthei Railway Stations | මෙ/ටො. 65.0 |
| 05. | Dematagoda Yard | මෙ/ටො. 120.0 |
| | Total | මෙ/ටො. 305.0 |

02. ලංසු භාර ගැනීම 2017.12.20 වැනි දින ප.ව. 2.00 ට අවසන් වෙයි.

03. ආපසු ගෙවනු නොලබන රු. 3,500 ක (රුපියල් තුන්දහස් පන්සියයක) ලියකියවිලි ගාස්තුවක් දුම්රිය සේවා ප්‍රධාන මූල්‍ය නිලධාරි කාර්යාලයට ගෙවීමෙන් 2017.12.19 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී සිදුකරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින්ට පැමිණෙන ලෙසට ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී සිදුකළ හැකිය.

07. වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවෙහි දුම්රිය ගබඩා අධිකාරි විමසන්න.

දුරකථන අංකය : 2438078/2436818
ෆැක්ස් අංකය : 2432044
ඊමේල් srs.slr@mail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7539

12-474

## පළාත්බද මහාධිකරණය - කුරුණෑගල

### රාජසන්තක කරන ලද වාහන ටෙන්ඩර් මගින් විකිණීම - 2017

කුරුණෑගල මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණය, නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය හා හෙට්ටිපොල මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රථ වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මුද්‍රා තබන ලද ලංසු මිල ගණන් කැඳවනු ලැබේ. අදාළ ටෙන්ඩර්පත් 2017.12.18 වැනි දින සිට 2017.12.28 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ කුරුණෑගල මහාධිකරණ කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්පත් ගාස්තුව ලෙස ආපසු නොගෙවන රු. 100 ක මුදලක් හා ආපසු ගෙවන රු. 10,000 ක ටෙන්ඩර් තැන්පතු මුදලක් ද අයදුම්පත්‍රය ලබා ගන්නා අවස්ථාවේදී ගෙවිය යුතු වේ. අයදුම්පත්‍රය සමග ටෙන්ඩරයට අදළ සියලු තොරතුරු හා ටෙන්ඩර් කොන්දේසි ඔබට ලබාදීමට නියමිතය. සියළුම රථවාහන අදළ අධිකරණයන්හි දී හා වාහන රැඳවුම් ස්ථානවලදී පෙ. ව. 9.00 සිට ප. ව. 3.30 දක්වා කාර්යාල දිනයන්හි දී නිරීක්ෂණය කළ හැක.

**මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල**

| නඩු අංකය | ලියාපදිංචි අංකය | වාහන වර්ගය හා වෙළඳ නාමය | චැසි අංකය හා ඇංජින් අංකය | වාහන භාවිතා කළ හැකි ආකාරය |
|---|---|---|---|---|
| 32233/11 | 43-1694 | ලොරි රථය (ඉසුසු) | NKR 57 E 0503969 4 BC 2-801294 | ලියාපදිංචි කළ හැක |
| 37058/11 | NW -PP7036 | ලොරි රථය (ටාටා) | MAT445051 A2 R 62938<br>275IDIOSJZYSC 9769 | ලියාපදිංචි කළ හැක<br>ලියාපදිංචි කළ හැක |
| 43647 | LC -7139 | ලොරි රථය | T 59004032 MOS<br>D18005833 | ලියාපදිංචි කළ හැක<br>ලියාපදිංචි කළ හැක |
| 59616 | NW-AAE 0909 | ත්‍රිවිල් රථය (බජාජ්) | MD2 A25 BZSCWH 956<br>33 - F/STD AFZWCH 35840 | ලියාපදිංචි කළ හැක<br>ලියාපදිංචි කළ හැක |

**මහෙස්ත්‍රාත් අධිකරණය - හෙට්ටිපොල**

| නඩු අංකය | ලියාපදිංචි අංකය | වාහන වර්ගය හා වෙළඳ නාමය | චැසි අංකය හා ඇංජින් අංකය | වාහන භාවිතා කළ හැකි ආකාරය |
|---|---|---|---|---|
| 5256 | 47 - 6873 | ටාටා | MAT 379040 S 8 R 16336<br>497D21EuQ744149 | අමතර කොටස් ලෙස |
| 22654 | 48-4120 | ටොයෝටා | BU96-0002724<br>14B - 1192074 | ලියාපදිංචි කළ හැක |
| 22682 | 227-5141 | ඉසුසු | KAD 51-7172552<br>ABE1 - 145520 | ලියාපදිංචි කළ හැක |
| 18746 | 227-5970 | මිට්ෂුබිසි කැන්ටර් | FE507B402730<br>4D33 - D 61669 | ලියාපදිංචි කළ හැක |

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය**

| නඩු අංකය | ලියාපදිංචි අංකය | වාහන වර්ගය හා වෙළඳ නාමය | චැසි අංකය හා ඇංජින් අංකය | වාහන භාවිතා කළ හැකි ආකාරය |
|---|---|---|---|---|
| 29751 | NWBCP 3960 | බජාජ් CT 100 | MD2A18AZ3FWC22225<br>DUZWFC 64406 | ලියාපදිංචි කළ හැක |
| ඒආර් 950/16 | - | බජාජ් RE 2ස්ට්‍රෝක් | F24DK08573<br>M24DK082971 | අමතර කොටස් ලෙස |
| 18381 | 24 ශ්‍රී 9795 | ටාටා 1210 | 3440883G7235736724303 | අමතර කොටස් ලෙස |
| 29889 | NWPP -2777 | ටාටා ACE | MAT445051AZR38042<br>275IDI05FZYS78685 | ලියාපදිංචි කළ හැක |
| 26258 | 36-3382 | මැසි පර්ගියුෂන් 135 | CE2152 6 U 523831 E | අමතර කොටස් ලෙස |
| 23196 | 227-8033 | මැස්ඩා ටයිටන් | WGFAT - 184307 154265 | ලියාපදිංචි කළ හැක |

මේනකා විජේසුන්දර,
සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන මණ්ඩලය,
මහාධිකරණය - කුරුණෑගල.

2017 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින,
කුරුණෑගල මහාධිකරණයේ දී ය.

12-426

# බඩු බාහිරාදිය විකිණීම්

## අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

### පරිහරණයට නුසුදුසු අබිලි භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මරදාන පොලිස් භූමියේ පිහිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා බඩු ගබඩාවේ ඇති පහත සඳහන් පාවිච්චියට නුසුදුසු අබිලි භාණ්ඩ 2017.12.20 වැනි දින පැය 0930 ට එම ගබඩා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පවත්වනු ලබන දිනට පෙර දින එම ගබඩාවේ දී භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

මිල දී ගනු ලබන භාණ්ඩවලට වහාම මුදල් ගෙවා එම භාණ්ඩ එදිනම භූමියෙන් ඉවත් කර ගත යුතුයි.

මෙම වෙන්දේසි ස්ථානයට වාහන රැගෙන නොයා යුතුයි.

මෙම වෙන්දේසිය සඳහා පැමිණෙන සියලු දෙනා තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලික හැඳුනුම්පත රැගෙන යා යුතුයි.

ජී.එස්. අබේසේකර,
අධ්‍යක්ෂ,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

### වෙන්දේසියේ ඇති භාණ්ඩ ලේඛනය

1. එයාර් කණ්ඩිෂන් කොටස්
2. එයාර් කණ්ඩිෂන්
3. ඇළුමිනියම් ජනෙල්
4. ඇළුමිනියම් හැඳි
5. යකඩ පොත් රාක්ක
6. බාල්දි
7. යකඩ බාල්දි
8. කැරකෙන පුටු
9. සිවිලිම් විදුලි පංකා
10. පොල්ගාන හිරමන
11. යකඩ කුෂන් පුටු
12. කල්දේරම්
13. සිවිලිම් විදුලි පංකා
14. සී. ඩී. ප්ලේයර්
15. සී. සී. ටී. වී. මොනිටර්
16. සී. සී. ටී. වී. කොටස්
17. සී. සී. ටී. වී. කැමරා
18. සී. පී. යූ. (පරිගණක)
19. යූ. පී. එස්. (පරිගණක)
20. මවුස් (පරිගණක)
21. මොනිටර් (පරිගණක)
22. පරිගණක කොටස්
23. පරිගණක ස්පීකර්
24. වෙන්ට් ඔවර්
25. පරිගණක කී බෝඩ්
26. කැමරා
27. ඩ්‍රැගන් ලයිට්
28. ඩ්‍රැගන් ලයිට් චාජර්
29. ඩිප් පිෂර්
30. ඩාග් රූම් ලයිට්
31. ඉමර්ජන්සි ලයිට්
32. විදුලි යතුරුලියන - ඉංග්‍රීසි
33. ඇළුමිනියම් විදුලි කේතල්
34. විදුලි කියත් කේස්
35. විදුලි යතුරුලියන ඉංග්‍රීසි
36. විධායක පුටු
37. විදුලි අයන්
38. එඩිටන් කොන්රෝල් යුනිට්
39. ශීතකරණ
40. ෆැක්ස් මැෂින්
41. පෑන් ලයිට්
42. ගෑස් කුකර්
43. කුඩා ගෑස් සිලින්ඩර්
44. ගෑස් ලාම්පු
45. කුඩා ජෙනරේටර්
46. යකඩ ගේට්ටු කොටස්
47. පොඩි යකඩ පෙට්ටි
48. යකඩ ජනෙල්
49. පිහි
50. ලොකු පිහිය
51. කුඩා පිහිය
52. යතුරු තහඩු
53. ලැප්ටොප්
54. ලන්තෑරුම්
55. මල්ටි පොට්
56. වීඩියෝ මයික්
57. මයික් මේසයේ සවිකරණ
58. පාපැදි
59. පෙට්‍රල් ලාම්පු
60. පින්ටර්
61. පෙඩෙස්ටියෙල් විදුලි පංකා
62. ඉබි යතුරු
63. පොජෙස්ටර්
64. පොලිසර්
65. පොජේස්ටර් ස්ලයිඩ්
66. ෆොටෝ කොපි මැෂින් කොටස්

67. කඩදාසි කපන කටර්
68. පොලිස්ටර් සමග පෝන් බෙල්
69. කැසට් රේඩියෝ
70. රේඩියෝ
71. රිචාර්ජබල් ලයිට්
72. අවි රඳවන යකඩ කොටස්
73. කතුරු
74. යකඩ මේස
75. සරනේරු
76. ස්ටෑන්ඩ් ෆෑන් (විදුලි පංකා)
77. සාස් පාන් - කුඩා
78. සාස් පාන් - ලොකු
79. වාහන පරීක්ෂා කරන කණ්නාඩි
80. ඉංග්‍රීසි යතුරුලියන
81. සිංහල යතුරුලියන
82. මේස විදුලි පංකා
83. ටියුබ් ලයිට් කේස්
84. ට්‍රයි පොට් සිල්ක් මාස්ටර්
85. ට්‍රයි පොට් එස්. ටී. 7
86. ටැන්ක් ඩිවලොපින් සිලින්ඩර්
87. රූපවාහිනී
88. වීඩියෝ කැමරා
89. වතුර බොයිලේරු
90. වතුර පිල්ටර්
91. බිත්ති විදුලි පංකා
92. බිත්ති විදුලි පංකා කොටස්
93. යකඩ පුටු
94. යකඩ කබඩ්
95. යකඩ අල්මාරි
96. ස්කැනර්
97. ඇලුමිනියම් ජෝගු
98. ඇම්පියර්
99. ඇලුමිනියම් ඇතිලි
100. පරිගණක වයර්
101. පරිගණක යූ. පී. එස්.
102. ඉලෙක්ට්‍රික් ඩ්‍රිල්
103. එක්ස්පොස් විදුලි පංකා
104. ලොකු ගෑස් සිලින්ඩර්
105. පොප් රිවට් ගන්
106. යකඩ හැඳි
107. යකඩ කපන කියත් තල
108. නෝපාකින් බෝඩ්
109. පොටෝකොපි මැෂින්
110. රෙගුලේටර්
111. රේක්ක
112. රවුටර්
113. ස්කුරුප්ප නියන්
114. යසිරන් නලා
115. හැඳි
116. තෙල් හැඳි
117. තාච්චි කුඩා
118. කායවර්ධන උපකරණ කොටස්.

12-431

---

# රජයේ නොවන දැන්වීම්

### පානම සර්ෆ් ඇන්ඩ් වයිල්ඩ් රිසෝර්ට්ස් (පීවීටී) එල්ටීඩී

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2017 සැප්තැම්බර් මස 19 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 125683 යටතේ ''පානම සර්ෆ් ඇන්ඩ් වයිල්ඩ් රිසෝර්ට්ස් (පීවීටී) එල්ටීඩී'' යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය, අංක 536, ආර්. ඒ. ද සිල්වා මාවත, කොළඹ 03, යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු),
නිත්ති මුරුගේසු ඇන්ඩ් ඇසෝසියේට්ස් නීතිඥවරු බාරේ,
අංක 28, (2 වන මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

12-338

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

කොටුගොඩ, යාගොඩමුල්ල, අංක 42/14 දරන ස්ථානයෙහි පදිංචි ගමගේ දෝන චන්ද්‍රා මන්ත්‍රීවිතාන (ජා. හැ. අ. 468071916 V) වන මා, නිශානි ප්‍රියංගනි විතාන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සකස් කරන ලද සහ 2004.05.08 වැනි දින මස්කට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී අත්සන් කරන ලද ඇටර්නි බලපත්‍රයෙන් තලංගම උතුර, කොස්වත්ත, අම්බලන්වත්ත, 4 වන පටුමග, අංක 65/4 දරන ස්ථානයෙහි පදිංචි මුතුගල පතිරන්නැහැලාගේ අබේරත්න මුතුගල මහතා වෙත ප්‍රදානය කරන ලද ඉහත ඇටර්නිබල පත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

12-347

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් දැනුම් දීමයි

අත්තනගල්ල, වෙලගෙදර, අංක 150/2 හි පදිංචි හෙට්ටිආරච්චිගේ හරිස්චන්ද්‍ර පෙරේරා (ජා. හැ. අංක 701043111V) වන මා විසින් වර්ෂ 2006ක් වූ පෙබරවාරි මස 17 වැනි දින දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී අත්සන් කළ වර්ෂ 2006.04.07 වැනි දින සහ දිනපොත් අංක 4644 යටතේ කොළඹ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ 325/127 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇති විදේශ ඇටර්නි බලපත්‍රයේ මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කළ අත්තනගල්ල, වෙලගෙදර, අංක 150/2 හි පදිංචි චාමිනී ප්‍රියංගිකා වනිගනෙත්ති (ජා. හැ. අංක 745950205 V) යන අය වෙත ලබා දුන් බලය අද දින සිට එනම් වර්ෂ 2017.08.20 වැනි දින සිට අහෝසි වන බවත්, එකී විදේශ ඇටර්නි බලපත්‍රය අද දින සිට සම්පූර්ණයෙන් අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් කටයුතු සිදු කිරීමට අදින් පසු ඉහත කී චාමිනී ප්‍රියංගිකා වනිගනෙත්ති යන අයට කිසිදු බලයක් නොමැති බවත් දන්වා සිටිමි.

හෙට්ටිආරච්චිගේ හරිස්චන්ද්‍ර පෙරේරා.

12-363

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම 2017 අගෝස්තු මස 22 වැනි දින සංස්ථාපනය කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගමේ නම : ජී. බී. සී. රිනිවබල් එනර්ජි සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී වී 124910
3. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 222 ඒ, පිළියන්දල පාර, මහරගම.

ජී. බී. සී. රිනිවබල් එනර්ජි සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලේකම්.

12-387

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොඩිතුවක්කු හාල් මෝල, නමඩගස්වැව, සූරියවැව පදිංචි ගොයිගොඩ ගමගේ මෙත්තානන්ද, අංක 82/2 ඒ පහජ්ජාව, නාකුළුගමුව පදිංචි ගොයිගොඩ ගමගේ ජයන්ත, කොඩිතුවක්කු හාල් මෝල, නමඩගස්වැව, සූරියවැව, පදිංචි කොඩිතුවක්කු කංකානම්ගේ මාලනී රුහුණු සෙවණ බරවකුඹුක පදිංචි, ගොයිගොඩ ගමගේ දයානන්ද රන්කොත්මළු නිවස, වගේගොඩ, තංගල්ල, පදිංචි ගොයිගොඩ ගමගේ ග්‍රේෂන් හා අංක 131, මහින්දපුර, පන්නෙගමුව, වීරවිල පදිංචි මුණසිංහ ආරච්චිගේ ඉන්දික යන අපි විසින් අංක 134, මහ බෝලාන අම්බලන්තොට පදිංචි එදිරිවීර පටබැඳිගේ නන්දසේන යන අය වෙත බලය පවරමින් ප්‍රසිද්ධ නොතාරිස් එම්.කේ. එම්. මහ්සුම් මහතා විසින් වර්ෂ 2013.03.20 වැනි දින ලියා සහතික කරන ලද අංක 6141 දරන ඇටර්නි බලපත්‍රය 2017.12.15 වැනි දින සිට අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදු කරන කිසිදු ක්‍රියාවන්ට අප හට වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙමු.

1. ගොයිගොඩ ගමගේ මෙත්තානන්ද
2. ගොයිගොඩ ගමගේ ජයන්ත
3. කොඩිතුවක්කු කංකානම්ගේ මාලනී
4. ගොයිගොඩ ගමගේ දයානන්ද
5. ගොයිගොඩ ගමගේ ග්‍රේෂන්
6. මුණසිංහ ආරච්චිගේ ඉන්දික.

12-410

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 07, රොස්මීඩ් පෙදෙස, අංක 8/1 හි පදිංචි වෛද්‍ය මයිකල් ජයකුමාර් සිවප්‍රකාසම් (අංක 487651839 දරන ඇමරිකානු එක්සත් ජනපදයේ විදේශ ගමන් බලපත්‍රය හිමි) (පහතින් කියවෙන ඇටෝර්නි බලපත්‍රයේ ප්‍රධානියා වන) විසින් ප්‍රධානය කරනු ලැබූ ඩබ්. වී. 25309, සවුත් චාල්ස්ටන්, ට්වින් බීච් ලේන්, අංක 124 හි පදිංචි වෙස්ට් ව(ර්)ජිනියා ජනපදයේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. මිචෙල් බැලී විසින් සහතික කරන ලද 2016 අප්‍රේල් මස 05 දිනැති ඇටෝ(ර්)නි බලපත්‍රය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 07, රොස්මීඩ් පෙදෙස, අංක 8/1 හි පදිංචි කනගරත්නම් නිර්මලන් (ජාතික හැඳුනුම්පත් අංක 403501611 V හිමි)වන මා විසින් 2017 නොවැම්බර් මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව වෙත සහ මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී 2016 අප්‍රේල් මස 05 දිනැති ඩබ්. වී. 25309, සවුත් චාල්ස්ටන්, ට්වින් බීච් ලේන්, අංක 124 හි පදිංචි වෙස්ට් ව(ර්)ජිනියා ජනපදයේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. මිචෙල් බැලී විසින් සහතික කරන ලද ඇටෝ(ර්)නි බලපත්‍රය යටතේ කරනු ලැබිය යුතු කිසිවක් සම්බන්ධයෙන් මා විසින් වගකීම භාර නොගන්නවා ඇත.

කනගරත්නම් නිර්මලන්.

2017 ක් වූ නොවැම්බර් මස 15 වැනි දින දීය.

12-413

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සියනෑ මයික්‍රො ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : 49/ඊ/1, කොළඹ පාර, බැන්ඩියමුල්ල, ගම්පහ
සංස්ථාගත කළ දිනය : 2016 මාර්තු 28
ලියාපදිංචි අංකය : පී වී 112667

සමාගමේ ලේකම්.

12-418

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය අනුව පහත සමාගම් සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමු.

(1) වෙළඳ සමාගමේ නම : ස්ලින්ටෙක් ඇකඩමි
ලියාපදිංචි අංකය : ජීඒ 3399
ලියාපදිංචි කළ දිනය : 2017 ඔක්තෝබර් 23
ලියාපදිංචි කාර්යාලය : නැනෝ ටෙක්නොලොජි ඇන්ඩ් සයන්ස් පාක්, මාහේන්වත්තල, පිටිපන, හෝමාගම.

(2) වෙළඳ සමාගමේ නම : ජේ ඩී ටෙක්නොලජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 125998
ලියාපදිංචි කළ දිනය : 2017 ඔක්තෝබර් 02
ලියාපදිංචි කාර්යාලය : යුනිට් 01/03, අංක 18, ග්‍රෙගරීස් පාර, කොළඹ 7.

එන් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

12-447

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි.

සමාගම් නාමය : ඉලෙක්ටා එන්ජිනීරින්ග් සීමාසහිත පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී එල් 127249
සංස්ථාගත කළ දිනය : 2017 නොවැම්බර් 14
ලියාපදිංචි කාර්යාලය : අංක 61/28/ඒ, බෝදියන්ගන මාවත, මහනුවර.

ලේකම්.

12-462

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ කුළුගම්මන සියපත්තුවේ නුගවෙල, උයන්වත්ත, කුරුණෑගල පාර, අංක 454 දරන ස්ථානයේ පදිංචි අංක 562041222 වී දරන ජාතික හැඳුනුම්පත දරන මොහොමඩ් ෂරීෆ්දීන්ගේ පුත් මොහොමඩ් තාරික් වන මා විසින් වර්ෂ 2003 ක් වූ ඔක්තෝබර් මස 06 වැනි දින ඕ. ටී. එන්. නවරත්න ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 3634 දරන විශේෂ ඇටෝර්නි බලකරය මගින් ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උයන්වත්ත, කුරුණෑගල පාර, අංක 454 දරන ස්ථානයේ පදිංචි උස්වත්ත ලියනගේ සුජීවා සජීවනී පෙරේරා විවාහයෙන් පසු රිස්වානා සේනාස් තාරික් නමැති අය එකී බල ඔප්පුවේ සඳහන් කාර්යයන් සඳහා මාගේ සත්‍යවූත් නීත්‍යානුකූලවූත් ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරන ලදී. වර්ෂ 2017ක් වූ නොවැම්බර් මස 28 වැනි දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ලලිතා කළුගල්ල මහත්මිය විසින් සහතික කරන ලද අංක 284 දරන ඇටෝර්නි බල ඔප්පු අවලංගු කිරීමේ ලේඛනය මගින් ඉහතින් විස්තර කරන ලද්දවූ ඇටෝර්නි බලය සහ එමගින් උස්වත්ත ලියනගේ සුජීවා සජීවනී පෙරේරා විවාහයෙන් පසු රිස්වානා සේනාස් තාරික් වෙත ප්‍රදානය කරන ලද්දවූ ද ප්‍රදානය කිරීම සඳහා අදහස් කරන ලද්දවූ ද, සියලු බලතල හා එමගින් ප්‍රදානය කරන ලද්දවූ ද බලපුලුවන්කාරකම් වහාම ක්‍රියාත්මක වන පරිදි මා විසින් අවලංගු කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇටෝර්නි බලකරු.

2017ක් වූ නොවැම්බර් මස 28 වැනි දින දී ය.

12-465

---

## විශේෂ ඇටර්නි බලකරය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී මහජනතාවටත් දන්වා ප්‍රකාශ කර සිටින්නේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර, පේරාදෙණිය තැපැල් හේන්දෙණිය අංක 34 හි පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ සෝමාවතී මැණිකේ (ජාතික හැඳුනුම්පත් අංක 388101377 වී), විජේසුන්දර මුදියන්සේලාගේ පුෂ්පකුමාර විජේසුන්දර (ජාතික හැඳුනුම්පත් අංක 641380134 වී) සහ විජේසුන්දර මුදියන්සේලාගේ චාන්දනී නයනා කුමාරි විජේසුන්දර(ජාතික හැඳුනුම්පත් අංක 658311956 වී) වන අප 2005 ක් වූ අප්‍රේල් මස 07 වැනි දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. සී. පොඩිමැණිකේ මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 11 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් අප විසින් හතරලියද්ද, මුඩගම්මන හි පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ කරුණාරත්න බංඩා යන අයට පවරන ලද ඇටර්නි බලය අවලංගු කර බලරහිත කරන ලද බවයි.

මින් ඉදිරියට අප ගැන හෝ අප වෙනුවෙන් ඉහත නම් සඳහන් වීරසිංහ මුදියන්සේලාගේ කරුණාරත්න බංඩා යන අය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීතිමය හෝ වෙනයම් ක්‍රියාවක් පිළිබඳව

කිසිම වගකීමක් අප විසින් භාර නොගන්නා බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමු.

වී. එම්. සෝමාවතී මැණිකේ,
වී. එම්. පුෂ්පකුමාර විජේසුන්දර,
වී. එම්. සී. නායනා කුමාරි විජේසුන්දර.

12-476

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

### සියලු දෙනාගේ ම දැනගැනීම පිණිසයි

නින්දන, බොරලුවතොට, අංක 138/ඒ යන ලිපිනයෙහි පදිංචි කුමාරි නයනා ඇන්තනී වන මා විසින් 2017.10.19 වැනි දින බලපිටියේ ප්‍රසිද්ධ නොතාරිස් ගාල්ලගේ සිවන්ති වාෂිකා ද සිල්වා මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 04 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත අංක 375/59/බී ගල්ලවත්ත, රද්දෙළුව, සීදූව හි පදිංචි පාවලු ආරච්චිගේ රසික කුමාර වන අයට පවරා දී ඇති බලය මෙයින් අවලංගු කර අහෝසි කරන බව සියලු දෙනගේ දැන ගැනීම පිණිස පළ කරමි.

කුමාරි නයනා ඇන්තනී.

12-479

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඩියෝසිම් සොලුෂන්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 126774
ලියාපදිංචි ලිපිනය : අංක 137, නාගහවත්ත පාර, දළුගම, කැලණිය
ලියාපදිංචි දිනය : 2017 නොවැම්බර් 14

සමාගම් ලේකම්.

12-480

---

## දැන්වීමයි

මඩකලපුව , අංක 45, ලේක් වීදිය - 01 කේ පදිංචි ඒ. තිරුප්පදි මයා සහ ජී. තිරුප්පදි මහත්මිය යන අපි දෙදෙනා මේ නගරයට අයත්, මඩකලපුව, 57, උඩමහල වීදියේ පදිංචි (ජා.හැ. පත් අංකය 451314025 V ) යන අයවන තම්බාපිල්ලේ කුගදාසන් යන පුද්ගලයාට ලබාදුන් , අංක 368 හා 02.03.2012 දිනැති මඩකලපුවේ ප්‍රසිද්ධ නීතීඥ කේ. තුරයිරාජ සිංගම් මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටෝනි බලතලය අපගේ ස්වකීය කැමැත්ත අනුව මෙයින් අවලංගු කර අහෝසි කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ද එම ජනරජයේ මහජනතාව සියලුදෙනාටම ද මෙයින් දැනුම් දෙමු. ඉහත ඇටෝනි බලය මගින් තම්බාපිල්ලේ කුගදාසන් යන පුද්ගලයා විසින් අද දින සිටම කරනු ලබන සියලුම ක්‍රියාකාරකම්, ගනුදෙනු වලටද අප වග නොකියන බව මෙයින් ප්‍රකාශ කර සිටිමු.

අරුලානන්දම් තිරුප්පදි මහතා,
ගෞරිදේවි තිරුප්පදි මිය.

12 - 346

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාක්කපල්ලිය, හලාවත පාර, අංක 141 හි පදිංචි වර්ණකුලසූරිය ජූඩ් ප්‍රියන්ත ප්‍රනාන්දු වන මා විසින් බත්තරමුල්ල පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අංක 4756 යටතේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 118 කාණ්ඩයේ 15 පත්‍රිරුවේ ලියාපදිංචිව ඇති රෝම නගරයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වෙනුවෙන් බලයලත් නිලධාරි පෝෂිත පෙරේරා විසින් සහතික කරන ලද විදේශීය විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මහවැව පුංචිගංගොඩ 156 හි පදිංචි වර්ණකුලසූරිය ඈන් බියට්‍රිස් මල්ලිකා තමෙල් (ජා. හැ. අංක 617083205 වී) යන මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත්කළ අතර, එය මෙතැන් පටන් අවලංගු කරන බවත්, අය විසින් ඇටෝර්නි බලකාරිය ලෙස මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වගකීම් නොදරන බවත් ප්‍රකාශ කර සිටිමි.

12-419/1

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාක්කපල්ලිය, හලාවත පාර, අංක 141 හි පදිංචි වර්ණකුලසූරිය ජූඩ් ප්‍රියන්ත ප්‍රනාන්දු වන මා විසින් කුරුණෑගල පිහිටි සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අංක 3449 යටතේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 89 කාණ්ඩයේ 6817 පත්‍රිරුවේ ලියාපදිංචිව ඇති රෝම නගරයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වෙනුවෙන් බලයලත් නිලධාරි ඩී. ඩබ්ලිව්. ජිනදාස විසින් සහතික කරන ලද විදේශීය විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කාක්කපල්ලිය, හලාවත පාර, 141 හි පදිංචි වර්ණකුලසූරිය අනුරාධි නලින්දිකා තමෙල් (ජා. හැ. අංක 825891129 වී) යන මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත්කළ අතර, එය මෙතැන් පටන් අවලංගු කරන බවත්, ඇය විසින් මාගේ ඇටෝර්නි බලකාරිය ලෙස මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වගකීම් නොදරන බවත් ප්‍රකාශ කර සිටිමි.

12-419/2

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාක්කපල්ලිය, හලාවත පාර, අංක 141 හි පදිංචි වර්ණකුලසූරිය ජූඩ් ප්‍රියන්ත ප්‍රනාන්දු වන මා බත්තරමුල්ල පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අංක 7139 යටතේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 122 කාණ්ඩයේ 211 පිටුවේ ලියාපදිංචිව ඇති රෝම නගරයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වෙනුවෙන් බලයලත් නිලධාරි රාණි බුලත්වෙල විසින් සහතික කරන ලද විදේශීය විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කාක්කපල්ලිය, හලාවත පාර, 141 හි පදිංචි වර්ණකුලසූරිය අනුරාධි නලින්දිකා තමෙල් (ජා. හැ. අංක 825891129 වී) යන අය මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත්කළ අතර, එය මෙතැන් පටන් අවලංගු කරන බවත්, ඇය විසින් මාගේ ඇටෝර්නි බලකාරිය ලෙස මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වගකීම නොදරන බවත් ප්‍රකාශ කර සිටිමි.

12-419/3

### දැන්වීමයි

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි රජයටත්, මහජනතාවටත්, මෙයින් දන්වා සිටිනු ලබන්නේ 2015.07.27 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාරේ, අංක 127 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි කොටෙක්නා ලංකා පුද්ගලික සමාගම (පීවී 92268) විසින් වත්තල, හැඳල, කෙරවලපිටිය පාරේ, අංක 353/1 හි පදිංචි පලනිවෙල්පිල්ලෙයි රවිනාත් (ජා. හැ. අංක 653031424 V) යන අය වෙත පවරා දෙන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ඇති බවයි.

ඒ අනුව අපගේ කොටෙක්නා ලංකා පුද්ගලික සමාගමෙහි ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද ඉහත කී පලනිවෙල්පිල්ලෙයි රවිනාත් විසින් මින් ඉදිරියට කොටෙක්නා ලංකා පුද්ගලික සමාගම වෙනුවෙන් කරනු ලබන කිසිම කටයුත්තක් සම්බන්ධයෙන් වගකීමක් අප විසින් භාර නොගන්නා බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

කොටෙක්නා ලංකා පුද්ගලික සමාගම වෙනුවෙන්,

2017 නොවැම්බර් මස 24 වැනි දින.

12-509

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් - පී. එල්. සී. නුගේගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කටුවාවල හි පිහිටි ''ඇටඹගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ද සිල්වා විසින් 1991 ජූලි මස 07 වැනි දින මැන සාදන ලද අංක 1210 දරන පිඹුරේ ලොට් A දරන

ප්‍රමාණය පර්චස් දහසයයි දශම පහයි අට (අ. 0, රූ. 0 පර්.16.58)

විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

පහත විස්තර සඳහන් පාරක් වෙන්කිරීම මතුපිටින් හා ඒ තුළ ගමන් කිරීමේ ඇති අයිතිය ද සමග වේ.

1. ඉහත සඳහන් කටුවාවල හි පිහිටි ''ඇටඹගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ද සිල්වා විසින් 1991 ජූලි 07 වැනි දින මැන සාදන ලද අංක 1210 දරන පිඹුරේ ලොට් C දරන ප්‍රමාණය පර්චස් බිංදුවයි තුනයි දශම බිංදුවයි බිංදුවයි (අ. 0 රූ. 0 පර්. 03.00)

2. ඉහත සඳහන් කටුවාවල හි පිහිටි ''ඇටඹගහවත්ත'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. පී. පෙරේරා විසින් 1964 ජූලි 27 වැනි දින මැන සාදන ලද අංක 791 දරන පිඹුරේ ලොට් 15 (වෙන්කරන ලද අඩි 10ක් පළල පාර) පර්චස් පහළොවයි දශම පහයි හතර (අ. 0 රූ. 0ප ර්. 15.54)

තුසේපෙරේරා ලියනරාලලාගේ අමල් ප්‍රියන්ත ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 09 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.02 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.12.15 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2017.12.15 දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - බොරලැස්ගමුව හොරණ පාරේ RMV කාර්යාලය හමුවීමට මීටර් 300 කට කලින් පන්සල ඉදිරිපසින් පිහිටා ඇති ඇහැලපේ හංදියෙන් දකුණට ඇති මහරගම පාරේ යාර 300ක් පමණ ගියවිට ගල්වල හංදිය හමුවේ. එතැනින් දකුණට ඇති අඩි 10-15ක් පළල පාරේ යාර 100ක් ගිය පසු දකුණට හැරුණුවිට ඊළඟට හමුවන අඩි 10 පළල පාරේ යාර 150ක් ගියවිට එම පාර අවසාන වේ. එතැනින් වමට ඇති ඊළඟ අඩි 10ක් පළල බොරළු පාරේ යාර 20ක් පමණ ගිය විට අවසාන වශයෙන් අදළ දේපළට ලඟාවිය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බදද (VAT) ගෙවිය යුතුයි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නුගේගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
100, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.
දුරකථන අංක : 011- 5515198/011- 5515279
ෆැක්ස් අංකය : 011 2810944/011- 2827772.

12-389

---

**මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව**

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ''ඈ'' වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ඇරැව්වල පිහිටියා වූ ද, අළුබෝගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ජී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද අංක 682 හා 1989 නොවැම්බර් මස 18 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 A ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ධර්මසිංහගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් අංක 2 B ද, දකුණට : අංක 87 දරන පිඹුරේ (අඩි 15ක් පළල) ලොට් අංක 04 ද, බස්නාහිරට : අංක 87 දරන පිඹුරේ ලොට් අංක 01 ද, මායිම් වන්නා වූ එකී අංක 682 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල බෙද වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ වැවිලි හා වෙනත් සියලු දේත් ය.

පහත දක්වෙන ඉඩම් කොටස් උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් පොදු අයිතිවාසිකම් ද මීට ඇතුළත් වේ.

ඉහත කී ඇරැව්වල පිහිටියාවූ ද, අළුබෝවත්ත යයි කියනු ලබන ඉඩමේ ලොට් අංක 04, (අඩි 15 පළල පාර සඳහා වෙන් කිරීම) ලෙස සලකුණු කර ඇත්තාවූ ද, උතුරට ලොට් අංක 01 හා 02 ද, නැගෙනහිරට ලොට් අංක 03 ද, දකුණට : එච්. ජී. ප්‍රේමතුංගගේ අංක 394 දරන පිඹුරේ ලොට් අංක 5, 6 හා 1A යන කොටස් ද බස්නාහිරට : සුභ සාධක මාවත ද, මායිම් වන්නාවූ ද, බලයලත් මිනින්දෝරු ඩබ්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද අංක 87 හා 1983.09.11 වැනි දින දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම නවයයි එකක් (අ. 0, රූ. 0 පර්. 10.91) විශාල වූ ද බෙද වෙන් කරන ලද ඉඩම් කොටස නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2835/252.240 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2017 දෙසැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මහරගම සිට පිළියන්දල පාරේ කිලෝමීටර් 03ක් පමණ ඉදිරියට ගිය විට හමුවන ඇරැව්වල මංසන්ධිය සහ ඇරැව්වල මහ විද්‍යාලය පසුකළ විට දකුණුපසට ඇති සුභසාධක මාවතේ මීටර් 200ක් පමණ ගමන් කළ පසු වමට ඇති ගුරු පාරේ මීටර් 50ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*වැඩි විස්තර සඳහා* .- 2016.06.24 වැනි දින දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත් හි පළ කළ දැන්වීම සහ 2016.04.22 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළකල දැන්වීම්වලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

01. ගැණුම් මිලෙන් 10%ක්,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
04. ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500ක්,
05. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ අංක 117 ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ (කොළඹ පිටත) ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011- 2812260, 011- 4305863 ෆැක්ස් අංකය : 011- 2813969.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි ගෙවිය යුතු හිඟ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා
තක්සේරුකරු උසාවි කොමසාරිස්,
හා දිවුරුම්ලත් භාෂා පරිවර්ථක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 071- 0821811, 071- 8021206.

12-458

---

## සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

සෙල්සිටි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0001 1008 5311.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2017.09.28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය අනුව රුපියල් දෙකෝටි තිස් එක් ලක්ෂ පන්දහස් හැත්තෑ හතයි ශත අනූ හතරක (රු. 23,105,077.94) මුදල ද, 2017 සැප්තැම්බර් මස 13 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි ලක්ෂයක (රු. 2,000,000.) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate +Two decimal Five per centum (2.5%) per annum (floor rate of 14%) තවත් රුපියල් පනස් එක් ලක්ෂයක (රු. 5,100,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate +Two per centum (2%) per annum (floor rate of 13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2017.11.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2017.11.14 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2018.01.12 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, දෙහිවල මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ දෙහිවල, කරගම්පිටිය, 539/4 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරගම්පිටියේ පිහිටි ශ්‍රී ප්‍රියදර්ශණාරාම පාර, අංක 12A දරන පරිශ්‍රයන් හි "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. වීරතුංග යන අය විසින් සාදන ලද 1996 ජූලි 19 දතම හා අංක $200^{A}$ දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රියදර්ශණාරාම පාර, නැගෙනහිරට : එච්. ඒ. සුසුලා යන අය විසින් හිමිකම් කියනු ලබන ශ්‍රී මේධන්කර පාර වරිපනම් අංක 7 දරන පරිශ්‍රයන් සහ ප්‍රියදර්ශණාරාම පාර, වරිපනම් අංක 14 දරන පරිශ්‍රයන්, දකුණට : ජේ. පී. ජයතුංග සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ශ්‍රී මේධන්කර පාර, වරිපනම් අංක 5/1 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : අංක 200 A දරන එකී පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙළහයි දශම අටයි දෙකක් (A. 0, R. 0, P. 12.82) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක $200^{A}$ දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3065/64 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-469

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඒ. පී. නාරංගොඩ සහ ජී. ඒ. එන්. ආර්. පෙරේරා.
ගිණුම් අංක : 1003 5322 7087.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010.03.25 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් නම ලක්ෂ අනූ හත් දහස් නමසිය තිස් අටයි ශත අසූ දෙකක (රු. 9,97,938.82) මුදල ද, 2010 ජනවාරි මස 19 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම ලක්ෂ හතලිස් හත් දහස් පන්සිය දහ අටයි ශත අසූ හතක (රු. 9,47,518.87) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.06.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.06.08 වැනි දින ''දිවයින'' ''අයිලන්ඩ්'' සහ ''තිනකුරල්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2017.12.29 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ ගංගොඩවිල ග්‍රාමයේ රබර් වත්ත පාර, 1 වැනි පටුමග හි පිහිටි වරිපනම් අංක 102 ඒ දරන ''එගොඩවත්ත'' යිය කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන එම්. එල්. එන්. පෙරේරා යන අය විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 01 දතම හා අංක 964 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 3 බී වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රබර් වත්ත පාර, 1 වැනි පටුමග නැගෙනහිරට : පාර, දකුණට : ලොට් 3 සී සහ බස්නාහිරට : ලොට් 3 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතරයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 14.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 964 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එම්. 2419/211 යටතේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-471

---

**පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ, දසියා පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොරස මැද 111/1 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ, මාබෝද්දල උපකාර්යාලය තුළ මාරපොල, දෙරණාගොඩ බලබෝවගම්වල පිහිටා ඇති, උඩුගම්පොල, නයිවල වරිපනම් අංක 470 සහ 472 දරන ''ඉඳිගොල්ල හෙවත් සිල්වා තැන්න වත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක ඒ. පී. වික්‍රමසිංහ විසින් සකසන ලද 2004.02.11 දිනැති අංක 2536 දරන පිඹුරෙහි ලොට් 1 වශයෙන් යනුවෙන් නිරූපිත බෙද වෙන් කරන ලද ඉඩම සහ ඒ මත ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ මත පිහිටි අනෙකුත් සියල්ල ද සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 437/66 හි ලියාපදිංචි කර ඇත.

බිම් ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 34
වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 15 වැනි දින පෙ. ව. 10.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය.-* ගම්පහ නගරයේ සිට මීනුවන්ගොඩ දක්වා දිවෙන පාරේ පිහිටි උඩුගම්පල නගරයෙන් නයිවල පාරේ සැතපුම් 2 ක් පමණ ගිය පසු කොරස හන්දිය පසුකර යාර 400ක් පමණ ගිය පසු ඇති පොදු පාසල පසුකළ සැනින් වම් පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

පාවුළුගේ සුනිමල් යන අය බන්ධනදයි/උකස්කරු ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.01.10 දිනැති අංක 184 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය.-* වර්ෂ 2017.07.06 වැනි දින ඩෙයිලි නිවුස්, ලක්බිම, තිනක්කුරල් පුවත්පත් සහ 2017.07.07 දිනැති ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවේලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

01. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
02. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙක හමාරක්),
04. ප්‍රචාරක වියදම් ද,
05. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
06. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.

වෙන්දේසි දිනයේ සිට වැඩකරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් ආදළ තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011- 4667412/011-4667237/011-4667229.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකථන/ෆැක්ස් අංකය : 081- 2210595
ජංගම දුරකථන අංක : 071- 4755974, 071-4962449.

12-478

HNB 257 - 17

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - හෙට්ටිවීදිය ශාඛාව (කලින් සීමා සහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්.එස්.හල්ලොලුව විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2011.10.04 වැනි දින සහතික කළ අංක 3016 දරන උකස් බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම පෙරියසාමි මහේශ්වරන් සහ මුතුගලගේ ඉනෝකා සංජීවනී මුතුගල යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2018 ක් වූ ජනවාරි මස 05 වැනි දින ප.ව. 2.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහනගර සභා සීමාව තුළ පහළ බෝමිරියෙහි පිහිටි ලැනරෝල් මාවතේ වරිපනම් අංක 38/20 දරන කලා හේනවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ.ඩී.පී.කේ. ප්‍රේමරත්න විසින් 1990.11.12 වැනි දින මැන සාදන ලද අංක 2896 දරණ පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 18 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස සහ එහි තුල ඇති ගොඩනැගිලි සහ සියලු දේත්, විශාලත්වය පර්චස් දහයකි. (අ. 0, රූ. 0, පර්.10)

ඉහත සඳහන් ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ.ඩී.විතාන විසින් 2011 අගෝස්තු 06 වැනි දින අංක 3104 දරන පිඹුර අනුව මැතක දී මැනීමකින් එය පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහනගර සභා සීමාව තුළ පහළ බෝමිරියෙහි පිහිටි ලැනරෝල් මාවතේ වරිපනම් අංක 38/20 දරන තලාහේනවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම, පර්චස් නවයයි දශම හතයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 9.70) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

එකී අංක 3016 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කොට ඇති මාර්ග මතින් ප්‍රවේශ අයිතියද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.09.08 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2017.09.14 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත ද බලන්න.

ඉඩමට පිවිසීම .- කඩුවෙල නගරයේ සිට හංවැල්ල පාරේ ලැනරෝල් මාවත දක්වා ගමන් කරන්න. ඉන් වමට හැරී එම ලැනරෝල් මාවතේ කොන්ක්‍රීට් අතුරා ඇති පාර දක්වා මීටර් 150 ක් පමණ ගමන් කරන්න. ඉන් දකුණට හැරී දේපළට ළඟාවීමට එම කොන්ක්‍රීට් අතුරා ඇති පාරේ මීටර් 100 ක් පමණ ඉදිරියට යන්න. එම පාරේ දකුණත පැත්තේ දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැංක් පී.එල්.සී. අංක 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක. 156 - 1/13
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක - 0777 378441
0714 424478
ෆැක්ස් - 0112 - 3459

12 - 342